මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PFD/RED/REG/02/CC/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.05. 28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ගිණුම්**

2018 ජූලි මස 20 වන දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 වන වගන්තිය අනුව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසුව මාස 05 ක් තුළදී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කළ යුතු වේ.

02. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව, ඔබ විසින් විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු බව සඳහන් වේ. 2002.09.12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි විධිවිධාන හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු යොමු අංක PFD/RED/COPA/2019/01 හා 2020.01.30 දිනැති ලිපියෙන් හඳුන්වා දී ඇති ආකෘතිය භාවිතා කරමින්, ඔබ ආයතනය සහ ඔබ යටතේ පවතින සියළුම ආයතන 2019.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ වාර්ෂික ගිණුම් සමඟ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව ද, අංක 269/2019 හා 2019.10.15 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන අනුව 2020.02.28 වන දින වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇතැයි අදහස් කරමි.

03. ඉහත 02 ඡේදයේ සඳහන් පරිදි ඔබ ආයතන විසින් විගණකාධිපතිවරයා වෙත අදාළ වාර්තා ඉදිරිපත් කර තිබුණද, 2020 වර්ෂයේ මාර්තු මස මැද භාගයේදී ඇති වූ ශ්‍රී ලංකාවටත් බලපාන ලද COVID-19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් රජයේ ආයතනවල සාමාන්‍ය දෛනික රාජකාරි කටයුතුවලට බාධා ඇති වූ බැවින්, ඔබ විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තා ඔබ වෙත ලැබීම ප්‍රමාද වීම හෝ වෙනත් කිසියම් හේතු මත රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි විධිවිධාන අනුව, මුදල් වර්ෂය අවසන් වී දින 150 කට පෙර 2019 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපහසුතාවයක් ඇති බව විගණකාධිපතිවරයා ද ඇතුළු නිලධාරීන් සමඟ ජනාධිපති ලේකම් කාර්යාලයේදී 2020.05.28 දින පැවති රැස්වීමකදී සාකච්ඡා විය. ඒ අනුව, 2019 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ දිනය 2020.06.30 දින දක්වා දීර්ඝ කරන බව කාරුණිකව දන්වමි.

ආර්.එම්.පී. රත්නායක
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

අත්:කලේ /එස්. ආර්. ආටිගල
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01.ජනාධිපති ලේකම්

02. අග්‍රාමාත්‍ය ලේකම්

03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

05. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

06. සභාපති, මුදල් කොමිෂන් සභාව